නිපුණතාව 4.0 - මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.

නිපුණතා මට්ටම 4.7 - ගනුදෙනු පොදු ජර්නලය ඇසුරින් සටහන් කරයි.

01.)1.පොදු ජර්නලය පැහැදිලි කරන්න.

2.පොදු ජර්නලයක සටහන් කෙරෙන ගනුදෙනු වර්ග 6ක් ලියන්න.

02.)පොදු ජර්නලයක සටහන් ඇතුළත් කිරීමේදී උපයෝගී කර ගන්නා මූලාශ්‍ර ලේඛනය කුමක්ද?

03.)පහත සඳහන් ප්‍රකාශන සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

1.පොදු ජර්නලය මූලික සටහන් පොතක් මෙන්ම ලෙජර් ගිණුමක් ලෙසටද කටයුතු කරයි.(      )

2.ගනුදෙනුවට අදාළ හර හා බැර සටහන පොදු ජර්නලයක සටහන් කර ඊට අදාළ පැහැදිලි කිරීම,සංලක්ෂය මගින් සිදු කෙරේ.(      )

04.) සමනලීගේ ව්‍යාපාරයට අදාළ පහත සඳහන් තොරතුරු ඔබට ඉදිරිපත් කරයි.

| 1)2020/01/01 දින ශේෂයන් | රු. |
|---|---|
| යන්ත්‍රෝපකරණ | 40,000 |
| ලී බඩු | 25,000 |
| බඩු තොග | 18,000 |
| මුදල් | 60,000 |
| ණයගැතියෝ | 40,000 |
| ණයහිමියෝ | 50,000 |
| ප්‍රාග්ධනය | ? |

2)සමනලී ව්‍යාපාරයේ කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා රු.16,000ක ලී බඩු ණයට මිලදී ගැනීම.
3.)යන්ත්‍රයක් රු.22,000කට සපුමලීට විකිණීම.
4)සේවක වැටුප් සඳහා ගෙවූ රු.8,000ක් විවිධ වියදම් ගිණුමේ සටහන් කර තිබීම.

අවශ්‍ය වන්නේ,
1.පොදු ජර්නලය
2.ලෙජර් ගිණුම් පිළියෙල කිරීම.